*සැ. යු.*- 2017.05.12 වැනි දින පළ වූ අංක 2,019 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,020 - 2017 මැයි මස 19 වැනි සිකුරාදා - 2017.05.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 366 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ජූනි මස 09 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මැයි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


365- B 081171— 353 (2017/05)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.

පෙර

එම්. සී. එස්. එල්. ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ් සහ මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්, බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

*පැමිණිලිකරු.*

නඩු අංකය : CHC 448/2012/MR

*එදිරිව*

1. විමලසිංහගේ පියතිස්ස
2. කහන්දුගොඩ කංකානම්ගේ චන්ද්‍රිකා රාණි අලවතුගොඩ

*දෙදෙනාම :*

අංක 106/5, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, මාදින්නාගොඩ, රාජගිරිය.

*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2013ක් වූ ඔක්තෝබර් මස 09 වැනි දින දරන සමථ තීන්දු ප්‍රකාශය පරිදි ඉහත සඳහන් කර ඇති 1 සහ 2 විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු කාලීන ණය පහසුකම් අංක HOCRTL1000278000 යටතේ 2012.06.25 දිනට රුපියල් හැටඑක් ලක්ෂ තිස් දෙදහස් දෙසිය තිස්පහයි ශත හැට හය (රු. 6,132,235.66) ක මුදලක් සහ 2012.06.26 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් මසකට 4% බැගින් පොලිය ද සමග අයකර ගැනීම සඳහා පැමිණිලිකරු හිමිකම් ලබන බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

මෙහි වූ උපලේඛනයෙහි විස්තර කොට ඇති මුළු ඉඩම් කැබලි (මෙහි මින්මතු ''උකස් කරන ලද දේපළ'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ මත පිහිටි ගොඩනැගිලි සහ ව්‍යුහයන් ද, එකී උකස් කරන ලද දේපළ විෂයෙහි, එයින් එයට හෝ ඒ මත සියලු ඉඩකඩම්, අයිතිවාසිකම්, හිමිකම්, දේපළ සම්බන්ධතා, හිමිකම්පෑම් හා ඉල්ලීම් ද සමග කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. පොන්නයියා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1247 සහ වර්ෂ 2010.07.12 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය යටතේ හා ඒ ප්‍රකාර ඉහත කී මුදල් අයකර ගැනීම පිණිස බැඳී ඇති බවට හා ක්‍රියාවෙහි යෙදවිය හැකි බවට සහ ඉහත කී මුදල් අයකර ගැනීම අරභයා එකී උකස් බැඳුම්කරය ක්‍රියාවෙහි යෙදවීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට ද, අණකොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

එකී මුදල්, නඩු ගාස්තු සමග තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක (2) ක කාලයක් ඇතුළත පැමිණිලිකරුට ගෙවන ලෙස විත්තිකරුට ආඥකරමින් හා එසේ ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් දූනට ගෙවා ඇති රුපියල් හය ලක්ෂ අනූහය දහසක (රු. 696,000) මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ උපලේඛනයේ දක්වා ඇති ඉඩම හා ගොඩනැගිලි අධිකරණය විසින් පත්කරනු ලබන බලයලත් වෙන්දේසිකරුවකු මගින් විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කර ඇති හෙයින් ද,

එකී වෙන්දේසිය පැවැත්වීමට ගරු අධිකරණය විසින් මා පත්කොට සංස්ථාපනය කර ඇති හෙයින් පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් දේපළ, ඒවා පිහිටි ස්ථානයේ දී ම,

2017 ජුනි මස 12 දින ප. ව. 3.00ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තව ද, මෙම ප්‍රසිද්ධ වෙන්දේසියේ ලංසු තබා දේපළ මිළදී ගන්නා ගැණුම්කරු වෙන්දේසියේ සම්පූර්ණ ගැණුම් මුදල හෝ එම මුදලින් 25%ක් ද, වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු එම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75% දින 30ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*දේපළට ප්‍රවේශ මාර්ගය* : කොළඹ කොටුවේ සිට වැලිකඩට ගොස් එතැන් සිට කිලෝමීටරයක් පමණ රාජගිරිය පාරෙන් මාදින්නාගොඩට ගොස් එතැනින් තවත් කිලෝමීටරයක් පමණ එම පාරේ ඉදිරියට ගොස් වමට හැරී අඩි 12ක් පමණ පළල පුද්ගලික පාරේ මීටර් කීපයක් ඉදිරියට ගිය විට අදල දේපළ වම් පැත්තේ හමුවන මෙම ඉඩමට ප්‍රවේශ විය හැකි ය.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ එම්. ඩී. එච්. ජයවර්ධන මාවතේ පෙර (කලින් මාදින්නාගොඩ පාර) මාදින්නාගොඩ පිහිටි ''කොස්ගහවත්ත'' නමැති ඉඩමට වර්ෂ 1989.08.22 දින බලයලත් මිනින්දෝරු සී. ජීරසිංහ මානක තැන විසින් මැන සාදන ලද අංක 1476 දරන පිඹුරේ කැබලි අංක 2ට මායිම්, *උතුරට* : පිඹුරු අංක 1476 හි කැබලි අංක 1, *නැගෙනහිරට* : අඩි 6ක් පළල පාර, *දකුණට* : පිඹුරු අංක 1476 හි කැබලි අංක 2 A සහ *බටහිරට* : පාර (අඩි 15ක් පළල) යන මායිම් තුළ පිහිටි පර්චස් බිංදුවයි හතක් (අක්. 0, රූ. 0, පර්. 07.00) විශාලත්වයෙන් යුතු ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1628/117 සහ G 1628/266 දරන පත්‍ඉරුවල ලියාපදිංචි වී ඇත.

පාර තුළින් සහ මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ එම්. ඩී. එච්. ජයවර්ධන මාවතේ පෙර (කලින් මාදින්නාගොඩ පාර) මාදින්නාගොඩ පිහිටි ''කොස්ගහවත්ත'' නැමති ඉඩමට වර්ෂ 1988.10.09 දින බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඔකඳපොල මහතා විසින් මැන සාදන ලද අංක 158/1988 දරන පිඹුරේ අඩි 15 පළල පාරට මායිම්, උතුරට : පිඹුරු එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, නැගෙනහිරට : ඊ. එස්. ආරියදස, ඩබ්. එන්. නෝනා සහ ආරියවතීට අයත් ඉඩම්, දකුණට : දයාවතී අමරසිංහට අයත් ඉඩම සහ පිඹුරු අංක 157/1988හි කැබලි අංක 4 සහ බටහිරට : ඉසබෙලා හාමිට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස වන කැබලි අංක A යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 21.20) විශාලත්වයෙන් යුතු ඉඩම් කොටස වේ.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක G 725/103 දරන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ප්‍රේමසිරි වඩුගේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමදාන විනිසුරු (මුළු දිවයිනටම)
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

2017 මාර්තු මස 16 වැනි දින,
කොළඹ 12, වාණිජ මහාධිකරණයේ දී ය.

05-591

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.